

අප අවධානය
යොමු කරන්නේ ලොව
වඩාත් ම වැදගත්
සකසුරුවම වෙතයි.
ඒ, ඔබේ
සකසුරුවම් බවයි.
ආරක්ෂිත තැන්පතු ලොකර
HSBC
Premier

**අප අවධානය යොමු කරන්නේ ලොව වඩාත් ම වැදගත් සකසුරුවම වෙතයි. ඒ, ඔබේ සකසුරුවම් බවයි.**

## ආරක්ෂිත තැන්පතු ලොකර

වේගවත් අද දිනයේ වඩා වැදගත් වන්නේ සිත සහනයයි. ඔබේ වටිනා දෑ ආරක්ෂාකාරී ලෙස තබාගැනීම පිණිස උසස් ප්‍රමිතියෙන් යුත් ආරක්ෂිත තැන්පතු ලොකර HSBC විසින් ඔබ වෙත පිරිනමන්නේ එබැවිනි.

ඔබගේ පහසුව හා පහසු ප්‍රවේශය සඳහා කොළඹ, යුනියන් පෙදෙස හා කොටුව ශාඛාවන් ශාඛාවන් හි ආරක්ෂාකාරී හා සුරක්ෂිත ස්ථානයන් හි අපගේ ආරක්ෂිත තැන්පතු ලොකර පිහිටුවා ඇත.

ස්වභාවික තත්ත්වයන්ට මුහුණුදීමේ හැකියාව සහිතව ඉදිකර ඇති අපගේ ආරක්ෂිත තැන්පතු ලොකර විශේෂ ආරක්ෂණ හා සුරක්ෂිත අංග රැසකින් සමන්විත බැවින් උසස් තත්ත්වයේ ආරක්ෂාව හා උපරිම ආරක්ෂණය ද ඒ හරහා ඔබ වෙත පිරිනමයි. අපගේ ආරක්ෂක අංශ කාර්ය මණ්ඩලය විශේෂිත පුහුණුව ලද අය වන බැවින්, ඔබේ වටිනා දෑ සම්බන්ධයෙන් වසරේ සෑම දිනක දී ම ඔබ වෙත ලැබෙන සුරක්ෂිත ආරක්ෂාව අපට සහතික කළ හැකිය.

### ගනුදෙනු කරන වේලාවන්

ඔබේ පහසුව පිණිස සතියේ දිනවල (බැංකු නිවාඩු දිනයන් හි දී හැර) පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා අපගේ ආරක්ෂිත තැන්පතු ලොකර වෙත පිවිසීමේ හැකියාව ඔබට ලබාදී ඇත.

### ලොකර පිළිබඳ විස්තරය

ඔබේ පහසුව හා ගබඩා කරතැබීමේ පහසුව සිත් හි තබාගෙන ප්‍රමාණ දෙකකින් ලොකර ඔබ වෙත පිරිනමනු ලබන්නේ, ඔබට කැමති ප්‍රමාණයක ලොකරයක් තෝරා ගැනීමේ විකල්පය සමඟ ය. එම ලොකර, 'මධ්‍යම' හා 'විශාල' ප්‍රමාණයෙන් වේ. ඒවායෙහි විස්තර නම්,

| | **උස** | **පළල** | **ගැඹුර** |
|---|---|---|---|
| මධ්‍යම | 5" | 5" | 24" |
| විශාල | 10" | 10" | 24" |

ඊට අමතරව, උපරිම ආරක්ෂාව සහතික කිරීම සහ අනවසර ප්‍රවේශවීම් වැළැක්වීම සඳහා සෑම ලොකරයකම ද්විත්ව අගුළු ක්‍රමවේදයක් සවිකර ඇති අතර, එක් යතුරක් ලොකරය කුලියට ගත් තැනැත්තා විසින් ද අනෙක් යතුර බැංකුව විසින් ද තබාගනු ලැබේ.

**සුදුසුකම්**

- HSBC Premier ගනුදෙනුකරුවන් සඳහා පමණි.

**කුලියට ගැනීමේ ගාස්තු**

විශාල ප්‍රමාණයේ ලොකර ගාස්තුව රු.10,000

මධ්‍යම ප්‍රමාණයේ ලොකර ගාස්තුව රු. 8,000

සැලකිය යුතුයි : ඉහත කුලියට ගැනීමේ ගාස්තු දැනුම්දීමකින් තොරව වෙනස්විය හැකි අතර, නව ගාස්තු අදාළ වනුයේ ඊළඟ කුලී කාලසීමාව සිට ය.

ආරක්ෂිත තැන්පතු ලොකරයක් සඳහා අයදුම් කිරීමට, ගමන් බලපත්‍ර සඳහා ගනු ලබන ප්‍රමාණයේ, මෑතක දී ලබාගත් ඡායාරූප (02)ක්, මෙම පොත්පිංච ට අමුණා ඇති අයදුම්පත හා අමුණා යුනියන් පෙදෙස ශාඛාව වෙත පුද්ගලිකව අතින් භාරදෙන්න. ආරක්ෂිත තැන්පතු ලොකර හෝ ඒවා සම්බන්ධ කටයුතු පිළිබඳ වැඩිදුර විස්තර හෝ ඔබට අවශ්‍ය නම්, කරුණාකර ඔබේ සබඳතා කළමනාකරු හෝ 4 4722 72 අංක හරහා HSBC Premier ඇමතුම් මධ්‍යස්ථානය අමතන්න.

**ආරක්ෂිත තැන්පතු ලොකර - අයදුම්පත, නීතිරීති සහ කොන්දේසි**

කළමනාකරු, .......................... කාර්යාලය

ද හොං කොං ඇන්ඩ් ෂැංහයි බැන්කිං කෝර්පරේෂන් ලිමිටඩ්

ශ්‍රී ලංකාව

සැලකිය යුතුයි : කරුණාකර මෙම පෝරමය **පැහැදිලි අකුරෙන්** සම්පූර්ණ කරන්න.

**ගනුදෙනුකරුගේ නම(නම්) (පවත්නා ගිණුම්වල සඳහන් ආකාරයට)**

**ලොකර අංකය :**

ලොකරය ලබාගත් දිනය :

තනි අයදුම්කරු :

උපන් දිනය :

බද්ධ අයදුම්කරු ඃ

උපන් දිනය ඃ

ලිපි ගනුදෙනු කෙරෙන ලිපිනය (බැංකුව වෙත ලබා දී ඇති ලිපිනයට වෙනස් නම්) ඃ

දුරකථන අංක(ය) ඃ    කාර්යාලීය ඃ

නිවස ඃ

ජංගම ඃ

ජා.හැ. අංකය ඃ

විද්‍යුත් තැපැල් ලිපිනය ඃ

ගනුදෙනුකාර අංකය ඃ

▫ විශාල ▫ මධ්‍යම ප්‍රමාණයේ ආරක්ෂිත තැන්පතු ලොකරයක් සඳහා වාර්ෂික කුලිය වශයෙන් රු. .................. ක මුදලක් කරුණාකර මාගේ / අපගේ ගිණුම් අංකයට හර කරන්න

| | |
|---|---|
| ගනුදෙනුකරුගේ අත්සන | දිනය |
| ගනුදෙනුකරුගේ අත්සන | දිනය |

**නීතිරීති සහ කොන්දේසි**

01. ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් ('බැංකුව') සහ ආරක්ෂිත තැන්පතු ලොකර (Safe Deposit Locker - SDL) භාවිතය සඳහා ඉල්ලුම්කර ඇති ගනුදෙනුකරු/වන් (කුලියට ගන්නා තැනැත්තා/තැනැත්තන්) අතර පවතින සම්බන්ධතාව බැංකුකරුවා සහ ගනුදෙනුකරුවා අතර සම්බන්ධයක් නොව, හිමිකරු සහ කුලියට ගන්නා තැනැත්තා අතර පවතින සම්බන්ධතාවකි.

02. ආරක්ෂිත තැන්පතු ලොකරයක් කුලියට ගන්නා තැනැත්තන් එක් අයෙකු හෝ වැඩි ගණනක් විසින් කුලියට ගත හැකි අතර එවැනි අවස්ථාවක දී එම එක් එක් තැනැත්තාට තනිව සහ වෙන වෙන ම ඊට ප්‍රවේශවීමට ඉඩ සලසනු ඇත. එය ඔහුගේ හෝ ඇයගේ නමින් පමණක් පවතින්නාක් මෙන් සම්පූර්ණයෙන්ම ඔවුන් එක් එක් තැනැත්තාගේ පාලනය යටතේ පවතිනු ඇත. දෙපාර්ශ්වයෙන් යම් පාර්ශවයක් එම ආරක්ෂිත තැන්පතු ලොකරයට ප්‍රවේශවීම සඳහා නියෝජිතයෙකු පත්කිරීමට කැමැත්තෙහි නම්, එම පත්කිරීම කුලියට ගන්නා අනෙක් තැනැත්තා (තැනැත්තන්) විසින් අනුමත කළ යුතු වේ.

03. ආරක්ෂිත තැන්පතු ලොකරයට ප්‍රවේශවීම සඳහා, කුලියට ගන්නා තැනැත්තා තමන් විසින් අවදානම දරමින් නියෝජිතයෙකු ('ඇටෝර්නි බලකරු') වෙත ලිඛිතව බලය පැවරිය හැක. මෙම බලය පැවරීම කොන්දේසි සහිත වනු ඇති අතර, කුලියට ගත් තැනැත්තා විසින් ලිඛිතව එකී බලය අවලංගු කරන තෙක් සහ එම ලිඛිත අවලංගු කරන ලද බව බැංකුව විසින් පිළිගන්නා තෙක් ආරක්ෂිත තැන්පතු ලොකරයේ එක් යතුරක් ඉදිරිපත් කරන ඇටෝර්නි බලකරුට සියලුම කාර්යයන් සඳහා ආරක්ෂිත තැන්පතු ලොකරයට ප්‍රවේශවීම සඳහා සහ එහි අඩංගු දෑ ඉවත් කිරීමට හෝ වෙනත් කටයුත්තක් කිරීමට සම්පූර්ණ බලය පවතින බවට සැලකෙනු ඇත. කුලියට ගත් තැනැත්තා විසින් ආරක්ෂිත තැන්පතු ලොකරයට ප්‍රවේශවීම සඳහා නියෝජිතයෙකු වෙත එවැනි බලය පැවරීමක් බැංකුව වෙතින් ලබාගත හැකි නිර්දේශිත ආකෘතිපත්‍රය (HSBC ආරක්ෂිත තැන්පතු ලොකර ඇටෝර්නි බලපත් ආකෘතිපත්‍රය) මඟින් පිරිනැමිය යුතු වේ. කුලියට ගත් තැනැත්තාගේ මරණය සිදුවූ විට සහ බැංකුව වෙත ඒ බව දැනුම් දුන් පසුව ඇටෝර්නි බලය අහෝසි වනු ඇත.

04. කුලියට ගත් තැනැත්තා සහ/හෝ ඇටෝර්නි බලකරු විසින් ආරක්ෂිත තැන්පතු ලොකරය සම්බන්ධව හෝ එහි අඩංගු ද සම්බන්ධයෙන් සිදුකරන යම් අනවසර හෝ වැරදිසහගත ක්‍රියාවක් සම්බන්ධයෙන් කුලියට ගත් තැනැත්තා මෙමඟින් බැංකුව හානිපූරණය කරයි.

05. ඔහුගේ /ඇයගේ ආරක්ෂිත තැන්පතු ලොකරයේ අඩංගු දෑ සඳහා රක්ෂණ ආවරණයක් ලබාගන්නා ලෙස කුලියට ගත් තැනැත්තා/ තැනැත්තන් වෙත උපදෙස් දෙනු ලැබේ.

06. බැංකුවේ සාමාන්‍ය ගනුදෙනු වේලාවන් තුළ ඕනෑම වේලාවක කුලියට ගත් තැනැත්තා/ තැනැත්තන්ට ආරක්ෂිත තැන්තු ලොකරයට ප්‍රවේශ විය හැකිය.

07. ආරක්ෂිත තැන්තු ලොකර පහසුකම ශ්‍රී ලංකාවේ පවතින අදාළ සියලුම නීති සහ රෙගුලාසි මඟින් පාලනය වනු ඇත.

08. කුලියට ගත් තැනැත්තා ආරක්ෂිත තැන්පතු ලොකරය හෝ ඉන් කොටසක් හෝ වෙනත් අයෙකුට පැවරීම සහ/හෝ නැවත කුලියට දීම හෝ යම් මත්ද්‍රව්‍යයක්, දියර වර්ග, පුපුරණ ද්‍රව්‍ය හෝ, ගිනිඅවි ද ඇතුළත්ව යම් නීතියක් යටතේ තහනම් වෙනත් කිසියම් ද්‍රව්‍යයක්, නීතිවිරෝධී කාර්යයකට සම්බන්ධ කිසියම් දෙයක් සහ නීතියෙන් සන්තකයේ තබාගැනීම තහනම් වන වෙනත් යම් දෙයක් උදා- නීතිවිරෝධී මත්ද්‍රව්‍ය සහ /හෝ ස්වභාවයෙන්ම අනතුරුදායක හෝ සාපරාධී වන දෑ හෝ, බැංකුවට හෝ කුලියට ගත් අනෙක්තැනැත්තන්ට පීඩාවක් විය හැකි දෙයක් තැන්පත් කිරීම සඳහා හෝ, වටිනා දෑ හෝ දේපල තැන්පත් කිරීම

සඳහා හැර වෙනත් කාර්යයක් සඳහා භාවිත කිරීම හෝ භාවිත කිරීමට හෝ අවසර දීම නොකළ යුතු වේ.

09. ආරක්ෂිත තැන්පතු ලොකරය ඉහත කී පරිදි අවභාවිත කෙරෙන බවට බැංකුව සැක කරන්නේ නම් කුලියට ගත් තැනැත්තා වෙත දැනුම්දීමක් සහිතව හෝ රහිතව ආරක්ෂිත තැන්පතු ලොකරයේ අඩංගු දෑ පරීක්ෂා කිරීම සඳහා බැංකුව අයිතිය රඳවා ගනියි. ඉහත 8 වන වගන්තියෙහි දක්වා ඇති අරමුණු ද ඇතුළත්ව යම් අරමුණක් සඳහා ආරක්ෂිත තැන්පතු ලොකරය අවභාවිත කෙරෙන බවට සිය තනි අභිමතය මත බැංකුව සෑහීමකට පත්වන අවස්ථාවක දැනුම්දීමක් රහිතව ආරක්ෂිත තැන්පතු ලොකර් පහසුකම වහාම අවසන් කිරීමට බැංකුව ට අයිතිය පවතී.

10. ආරක්ෂිත තැන්පතු ලොකරයේ සිදුකළ යුතු වන සියලුම අලුත්වැඩියාවන් බැංකුව විසින් නම් කරනු ලබන කාර්මිකයින් විසින් පමණක් සිදුකෙරෙනු ඇත.

11. යතුර/යතුරු නැතිවීමක දී සහ ආරක්ෂිත තැන්පතු ලොකරය සාමාන්‍ය පරිදි සහ සාධාරණ පරිදි භාවිතයෙන් පැන නොනගින අලුත්වැඩියාවන්වලදී එම නැතිවීමෙහි සහ/හෝ අලුත්වැඩියාවන්හි වියදම් (අවශ්‍ය වන්නේ නම් නව අගුලක් සඳහා යන වියදම් ද ඇතුළත්ව) කුලියට ගත් තැනැත්තා විසින් දැරිය යුතු වේ.

12. හදිසි අවස්ථාවකදී හැර, ප්‍රවේශවීම සම්බන්ධයෙන් සහ අලුත්වැඩියා සිදුකරන අවස්ථාවන්හි දී පරිශ්‍රය වෙත පැමිණ සිටීමේ අවශ්‍යතාවය සම්බන්ධයෙන් ද බැංකුව විසින් කුලියට ගත් තැනැත්තා වෙත සාධාරණ දැනුම්දීමක් සිදුකිරීමට යටත්ව, බැංකුව විසින් අවශ්‍ය යැයි හෝ සුදුසු යැයි සලකනු ඇති අලුත්වැඩියාවන් සිදුකිරීම සඳහා ආරක්ෂිත තැන්පතු ලොකරයට ප්‍රවේශවීමට කුලියට ගත් තැනැත්තා විසින් බැංකුවට අවසර දිය යුතුය.

13. ආරක්ෂිත තැන්පතු ලොකරය සම්බන්ධයෙන් කුලියට ගත් තැනැත්තා විසින් බැංකුව වෙත ගෙවිය යුතු වන කුලිය ආරක්ෂිත තැන්පතු ලොකර අයදුම්පතෙහි නම්කර ඇති ගිණුමෙන් කල්තබා වාර්ෂිකව සම්පූර්ණයෙන්ම අඩු කරගනු ඇති අතර, කිසිදු තත්ත්වයක් යටතේ එය ආපසු නොගෙවනු ඇත.

14. නම් කරන ලද ගිණුමෙහි ප්‍රමාණවත් මුදල් නොමැති අවස්ථාවක දී, ආරක්ෂිත තැන්පතු ලොකරය කුලියට ගැනීම සම්බන්ධයෙන් ඇති ඕනෑම ගාස්තුවක් අයකරගැනීම සඳහා බැංකුව විසින් ඕනෑම අවස්ථාවක දී කුලියට ගත් තැනැත්තා වෙත පූර්ව දැනුම්දීමකින්

තොරව අයදුම්පතෙහි දක්වා ඇති ගනුදෙනුකාර අංකය යටතේ ඇති කුලියට ගත් තැනැත්තාගේ වෙනත් යම් ගිණුමක් අත්හිටුවීමට හැකිය.

15. කුලියට ගත් තැනැත්තා/තැනැත්තන් ආරක්ෂිත තැන්පතු ලොකර පහසුකම ඉවත්කරගැනීමට කැමැත්තෙහි නම්, එක් එක් කුලී වර්ෂය අවසන්වීමට පෙර කුලියට ගත් තැනැත්තා බැංකුව වෙත අවම වශයෙන් එක් මාසයක (01) දැනුම්දීමක් ලිඛිතව ලබාදිය යුතු වේ. එසේ ඉවත්කරගැනීම බැංකුව විසින් පිළිගත් පසුව, වර්තමාන වර්ෂය සඳහා ගෙවන ලද කුලිය බැංකුව විසින් ආපසු නොගෙවනු ඇත.

16. එවැනි දැනුම්දීමක් සිදුකිරීමට අපොහොසත් වුවහොත් සහ 18 වගන්තියෙහි දක්වා ඇති ලෙස යතුරු ආපසු භාර නොදුනහොත්, ආරක්ෂිත තැන්පතු ලොකරය කුලියට ගත් තැනැත්තා තවත් වර්ෂයක් සඳහා අඛණ්ඩව භාවිත කරන බවට සැලකෙනු ඇති අතර, නව වර්ෂය සඳහා අදාළ අයකිරීම් 13 වගන්තියෙහි දක්වා ඇති ආකාරයට අඩුකරගැනෙනු ඇත.

17. ආරක්ෂිත තැන්පතු ලොකර පහසුකම අවසන් කිරීමට බැංකුව විසින් අදහස් කරන්නේ නම්, බැංකුව විසින් එසේ අවසන් කිරීම පිළිබඳව ඕනෑම අවස්ථාවක දී කුලියට ගත් තැනැත්තා වෙත එක් (01) මාසයක ලිඛිත දැනුම්දීමක් ලබාදිය හැකි අතර, එවැනි දැනුම්දීමක දක්වා ඇති එක් (01) මාසයක කාලය අවසන් වීමෙන් පසුව ආරක්ෂිත තැන්පතු ලොකර පහසුකම අවසන් වී ඇති බවට සැලකෙනු ඇත. එවැනි අවස්ථාවක දී ගෙවා ඇති යම් කුලී මුදලක් අනුපාතික පදනමින් බැංකුවේ අභිමතය පරිදි ආපසු ගෙවනු ඇත.

18. කුලිය අවසන් වන දිනයේ මධ්‍යහ්නයේ දී හෝ ඊට පෙර ආරක්ෂිත තැන්පතු ලොකරය එහි යතුරු ද සමඟ, එහි සාධාරණ භාවිතයෙන් අවසර දිය හැකි ආකාරයේ මනා තත්ත්වයෙන් යුතුව කුලියට ගත් තැනැත්තා විසින් බැංකුව වෙත භාරදිය යුතු වේ.

19. කුලියට ගත් තැනැත්තා විසින් කුලිය ගෙවිය යුතුව පවතින අවස්ථාවක දී එය නොගෙවීම මත හෝ මෙහි ඇති කිසියම් කොන්දේසියක් කඩකිරීම මත, කුලියට ගත් තැනැත්තාගේ එම කඩකිරීම යථා තත්ත්වයට පත්කරන ලෙස කාලසීමාවක් සහිතව, ගෙවිය යුතු කුලී මුදල් ගෙවන ලෙස හෝ මෙහි අඩංගු කිසියම් කොන්දේසියක් කඩකිරීම යථා තත්ත්වයට පත්කරන ලෙස නියම කරමින් ඔහුගේ නේවාසික/ලියාපදිංචි ලිපිනය වෙත ලිඛිතව දැනුම්දීමක් ලබාදීමට බැංකුව ට අයිතිය පවතියි.

20. 19 වගන්තියෙහි දක්වා ඇති ලෙස, කුලියට ගත් තැනැත්තා එසේ ගෙවීම හෝ යථා තත්ත්වයට පත්කිරීම අතපසු කරන්නේ නම්, ආරක්ෂිත තැන්පතු ලොකරය කඩා විවෘත කිරීමට ද, කුලියට ගත් තැනැත්තා විසින් ගෙවිය යුතු වන කුලී මුදලට සමාන වාර්ෂික කුලියක් මත, සුදුසු යැයි සලකන පරිදි එහි අඩංගු දෑ වෙනත් යම් ලොකරයක හෝ ස්ථානයක රඳවා තබාගැනීමට ද බැංකුවට නිදහස පවතිනු ඇත.

21. නොගෙවූ කුලී මුදල්, අලුත්වැඩියා සඳහා වන වියදම්, කුලියට ගත් තැනැත්තා වෙතින් සිදුවූ යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් මඟින් සිදුවූ යතුරු ප්‍රතිස්ථාපනය සඳහා කළ වැයකිරීම් සඳහා සහ, ඉහත කී පරිදි බැංකුව විසින් ආරක්ෂිත තැන්පතු ලොකරය කඩා විවෘත කිරීම මඟින් සහ අලුත්වැඩියා කිරීම සඳහා, අලුත් අගුලු සවිකිරීම හා යතුරු ප්‍රතිස්ථාපනය කිරීම සඳහා, බැංකුව විසින් ආරක්ෂිත තැන්පතු ලොකරයේ අඩංගු දෑ බැහැර කරන තෙක් ඒවා ගබඩා කර තබාගැනීම සඳහා බැංකුව විසින් දරන්නට සිදුවූ යම් වැයකිරීමක් සඳහා සහ, කුලියට ගත් තැනැත්තා ගේ නෛතික වගකීමක් වන සහ ඔහුගෙන් අයකරගත හැකිව පවතින සියලුම මුදල් සඳහා ආරක්ෂිත තැන්පතු ලොකරයේ අඩංගු දෑ මත බැංකුවට ලියමක් පවතිනු ඇත.

22. බැංකුව විසින් හෝ එහි සේවකයන් හෝ නියෝජිතයන්ගේ චේතනාන්විත ක්‍රියාවක්, අතපසු කිරීම් හෝ පැහැර හැරීමක් හේතුවෙන් සිදුව ඇත්තේ නම් හැර, ආරක්ෂිත තැන්පතු ලොකරයේ අඩංගු දෑ නැතිවීමක් හෝ හානිවීමක් සඳහා හෝ අගුලුවල හෝ දොරවල්වල යාන්ත්‍රික බිඳවැටීමක් නිසා සිදුවන ප්‍රමාදයක ප්‍රතිඵලයක් ලෙස ඇතිවන පාඩුවක් හෝ හානියක් සඳහා බැංකුව විසින් වගකීමට බැඳී නැත.

23. අයදුම්පතෙහි දක්වා ඇති ලිපිනයට (හෝ අවසන්වරට බැංකුව වෙත ලිඛිතව දන්වා ඇති වෙනත් ලිපිනයකට) කුලියට ගත් තැනැත්තා වෙත තැපෑලෙන් යොමු කර කුලියට ගත් තැනැත්තාට යවන ලද යම් දැනුම්දීමක් එය තැපැල් කිරීමෙන් දින හතක් තුළ ලැබී ඇති බවට සැලකෙනු ඇති අතර සාමාන්‍ය තැපැල් කටයුතු මඟින් කුලියට ගත් තැනැත්තා වෙත නිසි ලෙස දැනුම් දී ඇතැයි සැලකෙනු ඇත.

24. කුලියට ගත් තනි පුද්ගලයෙකුගේ මරණයක දී නෛතික නියෝජිතයින් විසින් හෝ අන්තිම කැමතිපත්‍ර රහිත වෙනත් උරුමකරුවන් විසින් හෝ එම කුලියට ගත් තැනැත්තාගේ මරණයෙන් දින 60ක කාලසීමාවක් තුළ එම කුලියට ගත් තැනැත්තාගේ මරණයෙන් පසු කාලසීමාව සඳහා වන කුලී ගෙවීම සම්බන්ධයෙන් සතුටුදායක ලෙස කටයුතු සූදානම් කර නොමැති අවස්ථාවක, ආරක්ෂිත තැන්පතු ලොකරය කඩා විවෘත කිරීමට ද, ප්‍රොබේට්

බලපත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය ලබාගැනීමෙන් පසු එහි අඩංගු දෑ මියගිය කුලියට ගත් තැනැත්තාගේ නෛතික නියෝජිතයා/ නියෝජිතයින් විසින් ඉවත්කරගන්නා තෙක් එහි අඩංගු දෑ සිය භාරයේ තබාගැනීමට ද බැංකුවට හිමිකම පවතිනු ඇත.

25. කුලියට ගත් තැනැත්තාට විරුද්ධව බුන්වත්භාවයේ තීන්දු නියෝගයක් හෝ නියෝගයක් ලැබීමෙන් පසුව හෝ, කුලියට ගත් තැනැත්තාට එරෙහිව බුන්වත්භාවය පිළිබඳ පෙත්සමක් ඉදිරිපත් කිරීම පිළිබඳ දැන්වීමක් ලැබීමෙන් පසුව ආරක්ෂිත තැන්පතු ලොකරයට ප්‍රවේශවීමේ අයිතිය තීරණය කරනු ඇත. කෙසේ වුවද මෙම ප්‍රතිපාදනය කුලියට ගන්නා තැනැත්තන් දෙදෙනෙකු හෝ වැඩි ගණනක් විසින් කුලියට ලබාගෙන ඇති අවස්ථාවක දී අදාළ නොවනු ඇත.

26. ඉහත දක්වා ඇති නීතිරීති සහ කොන්දේසි කිසිවක් එකතු කිරීමට, වෙනස් කිරීමට, සංශෝධනය කිරීමට හෝ ඉවත් කිරීමට ද ආරක්ෂිත තැන්පතු ලොකරය සම්බන්ධයෙන් හෝ ඊට අදාළව බැංකුව විසින් යෝග්‍ය යැයි සලකනු ඇති පරිදි සියලු නීතිරීති හා රෙගුලාසි පැනවීමට ද බැංකුවට සියලුම අවස්ථාවන් හි දී අයිතිය පවතිනු ඇති අතර, නීතිරීති හා කොන්දේසි, රීති හා රෙගුලාසිවල එම සියලුම වෙනස් කිරීම් මඟින් බැඳී සිටීමට කුලියට ගත් තැනැත්තා/තැනැත්තන් මෙමඟින් එකඟ වේ.

27. ගාස්තු සහ අයකිරීම්, නීතිරීති සහ කොන්දේසි, රීති හා රෙගුලාසි ඇතුළත්ව නමුත් ඊට සීමා නොවී, වෙනස් කිරීම් පිළිබඳ දැන්වීම ලිපියක් මඟින් දැනුම්දීම, දේශීය පුවත්පත්වල දැන්වීම් පළකිරීම, බැංකුවේ දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කිරීම, ප්‍රකාශන පණිවුඩය මඟින් හෝ සුදුසු යැයි සැලකෙන වෙනත් යම් ක්‍රමයකින් ලබාදීම කුලියට ගත් තැනැත්තා/තැනැත්තන් වෙත දැනුම්දීමක් ලබාදීමක් ලෙස අර්ථනිරූපනය කෙරෙනු ඇත.

28. කිසියම් ගනුදෙනුවක් පැහැර හැරියහොත් කුලියට ගත් තැනැත්තා/තැනැත්තන් සම්බන්ධයෙන් ජාත්‍යන්තරව ලැයිස්තුගත කර ඇති අදාළ කිසියම් ණය අවදානම් තොරතුරු කාර්යාංශයක් වෙත වාර්තා කිරීමට බැංකුවට හිමිකම පවතින බවට කුලියට ගත් තැනැත්තා/තැනැත්තන් මෙමඟින් කැමැත්ත පළකර පිළිගනිති.

29. කිසියම් අධිකාරියක් ආරක්ෂිත තැන්පතු ලොකරය පිළිබඳ තොරතුරු හෝ ඊට ප්‍රවේශවීමට ඉල්ලා සිටින්නේ නම්, එසේ කිරීමට නීතියෙන් නියම වී ඇති අවස්ථාවක එකී පාර්ශ්වයන් වෙත ප්‍රවේශය ලබාදීමට හෝ එම තොරතුරු සැපයීමට බැංකුව බැඳී සිටින බව කුලියට ගත් තැනැත්තා මෙමඟින් පිළිගෙන එකඟ වෙයි.

30. ආරක්ෂිත තැන්පතු ලොකර පහසුකම බැංකුවේ Premier ගනුදෙනුකරුවන්ට පමණක් ලබාදෙනු ඇත. බැංකුව විසින් කුලියට ගත් තැනැත්තාගේ තත්ත්වය Premier තත්ත්වයෙන් පහත හෙළනු ලැබුවහොත්, එසේ පහත හෙළීමේ දිනයේ සිට බලාත්මක වන පරිදි ආරක්ෂිත තැන්පතු ලොකර පහසුකම බැංකුව විසින් වහාම අවසන් කරනු ලැබීම මෙම නීතිරීති හා කොන්දේසිවල කොන්දේසියක් වනු ඇත. එවැනි අවස්ථාවක දී ගෙවන ලද යම් කුලියක් අනුපාතික පදනමින් බැංකුවේ අභිමතය පරිදි ආපසු ගෙවනු ඇත.

……………………………..……….. ……………………………………..
අයදුම්කරුගේ අත්සන ඇටෝර්නි බලකරුගේ අත්සන

ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බැන්කින් කෝර්පරේෂන් විසින් නිකුත් කරන ලදී.